**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ**

**සිංහල II**

**13 ශ්‍රේණිය**

**අවසාන වාර පරීක්ෂණය - 2023**

**පිළිතුරු පත්‍රය**

| | | | |
|---|---|---|---|
| (1). 5 | (6). 1 | (11). 1 | (16). 5 |
| (2). 2 | (7). 2 | (12). 2 | (17). 4 |
| (3). 1 | (8). 3 | (13). 4 | (18). 3 |
| (4). 4 | (9). 4 | (14). 3 | (19). 1 |
| (5). 3 | (10). 5 | (15). 2 | (20). 5 |

**සිංහල II**

(2). (අ)

i. අපූර්ව භාව අභිව්‍යක්තිය හා එමගින් ජනනය කරන රමණීයත්වය
ii. රසිකයාගේ සිත පුරවා දැවෙන විස්මය
iii. භාෂාව
iv. උක්ති ක්‍රම සියල්ල අලංකාරෝක්තියෙන් යොදා ගැනීම
v. උපමාව හෝ රූපකය මගින් සිදුවන භාෂාත්මක පද යෝජනයේ කාව්‍යයෙහි ලා අපේක්ෂිත චමත්කාරය නූපදවන විට
vi. වක්‍රතාව හා අතිශය කථනය

(ආ) සාරාංශය

- සිංහල හා දෙමළ රාජ්‍ය භාෂා වශයෙන් ක්‍රියාත්මක වේ.
- ඒ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ.
- ඒ පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවතිය ද ගැටලු පවතී.
- නිලධාරීන් හිඟවීම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම භාෂා අයිතින් උල්ලංගනය වීමට හේතු වේ.
- සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම සඳහා විවිධ සැලසුම් පවතී.
- ඉංග්‍රීසි භාෂාවේ ව්‍යාප්තිය නිසා අභියෝගයක් පවතී.
- රාජ්‍ය භාෂා ප්‍රවර්ධනය රාජ්‍ය ප්‍රතිපත්තිවල වැදගත් අංශයකි.

(3). රචනාව -

වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණක් ප්‍රදානය කළ හැකි ය. වචන 400 ට වැඩි නම් හෝ 250 ට අඩු නම් හෝ ලකුණු 03 ක් අඩු කළ යුතු ය. අවධානය යොමු කළ යුතු කරුණු (ලකුණු ලබාදීමේදී)

- ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
- සංවිධානාත්මක බව
- කරුණුවල පැහැදිලි බව
- නිරවද්‍ය අක්ෂර වින්‍යාසය
- ව්‍යාකරණ දෝෂ රහිත වීම
- භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
- සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම

(4). (අ)

i. ළමයි
ii. ළමයෙකු
iii. මා
iv. ළමයින්
v. දෙමාපියෝ
vi. මිනිසුන්

(ආ)

vii. කැරලිකරුවන් විසින් නගරය ආක්‍රමණය කරන ලදී.

viii. රූමත් හෙදියක විසින් වයසක මව සනසන ලද්දී ය. /සනසනු ලැබුවා ය / සැනසිණි

ix. තරුණයන් විසින් මහත් හරසරින් තරුණ දේශපාලකයා පිළිගැනුණි / පිළිගන්නා ලදි / පිළිගනු ලැබිණි / පිළිගනු ලැබුණේ ය / පිළිගන්නා ලද්දේ ය.

x. අධ්‍යක්‍ෂතුමා විසින් ලිපිකාරිණියක් කැඳවෙයි / කැඳවන ලදි / කැඳවන ලද්දී ය/ කැඳවනු ලැබිණි / කැඳවනු ලැබුවා ය

xi. මා විසින් පාතාල කල්ලි බිහිවන සමාජ ආර්ථික ව්‍යුහය පිරික්සෙයි / පිරික්සනු ලබයි

(ඉ)

xii. මිනිස්සු - දෙනෙක්

xiii. ගොවියෝ - කම්කරුවන්

xiv. මා - ඔවුහු

xv. ලේඛකයන් - පවත්වයි

xvi. නරඹන්නන් - ඔවුහු

(5).

| | වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|---|
| i. | බයිසිකලේ | විභක්ති | ආධාර විභක්ති / අදර විභක්ති |
| | තරුණ තරුණියෝ | සමාස | දකාරාර්ථ සමාසය |
| | කොළොම් තොටට | සන්ධි | ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය |
| ii. | අධ්‍යක්ෂතුමා | විභක්ති | ප්‍රථමා විභක්ති / පෙර විබත් |
| | දරන | කෘදන්ත | වර්තමාන කාල කෘදන්ත |
| | පෙන්වා | ක්‍රියා | පූර්ව ක්‍රියා |
| iii. | මහෞෂධ | සන්ධි | පෙරපර ලොප් සඳ/පූර්ව ස්වර ලෝප සන්ධි |
| | පඬිතුමාගේ | විභක්ති | සම්බන්ධ විභක්ති / සබඳ විබත් |
| | මහෝපකාරි | සන්ධි | ස්වරාදේශ සන්ධි / සරදෙස් සඳ |
| iv. | මුහුලස | තද්ධිත | අස් ප්‍රත්‍යය |
| | කළමැන | ක්‍රියා | විධි ක්‍රියා |
| | හෙළැඹුල | සන්ධි | පර ස්වර ලෝප සන්ධි |
| v. | දසබලධාරි | සමාස | අන්‍යාර්ථ සමාස / අන් අරුත් සමස් |
| | හිමාලේ | විභක්ති | අවධි විභක්ති / අවදි විබත් |
| | කිඳුරෙකු | සන්ධි | පූර්ව ස්වර ලෝප සන්ධිය / පෙරසර ලොප් සඳ |

(6). (අ)

i. උළෙල

ii. උත්සවය

iii. ප්‍රේමය

iv. පෙම්

v. දෝෂ

vi. දොස්

(ආ)

vii. මාතෘපස්ථාන

viii. තවෙකක්

ix. තුනුවග

x. තුම්මුල්ල

xi. අනේක

xii. අත්‍යුත්කෘෂ්ට

(ඉ)

xiii. කර්ම විභක්ති - ආලපන විභක්ති

xiv. සම්බන්ධ විභක්ති - සම්ප්‍රදාන විභක්ති

xv. කරණ විභක්ති - කරණ විභක්ති

(ඊ)

xvi. ''එහෙනම් අමනාප වෙන්නෙ නැතිව මං කියන දේ හොඳට අහගනින්. ගොවියා වැඩ කරන්නෙ කුඹුරේ නේද? නමුත් අහිකුණ්ඨකයා මොකද කරන්නේ ? ළඟ ගමේ ගෙයක් ගානේ හිඟාකනවා. ඉඩක් ලැබුණොත් හොරකම් කරනවා. උඹත් අන්න ඒ වගේ මිනිහෙක්. උඹ මොනවට ද ගමට ආවේ? හොරකමක් කරන්න නේද?.''

(උ)

xvii. තමා පසු දින කොළඹ යාමට සිටින බව මාමා කිවේ ය.

xviii. ඇය විභාගය හොඳින් සමත්වෙන බව ඔහු ඇයට කිවේ ය.

xix. ඇයට ඉවුරේ සිට උණුසුම් වන ලෙස දුයිෂෙන් අල්තීනාට කීවේ ය.

(7).

i. අභිමතය , අනතුරුව , ආරම්භ , ආනන්දනීය , ඓතිහාසික , අත්‍යවශ්‍ය

ii. අතීත + ආවර්ජනය
එකින් + එකා
අති + අවශ්‍යය

iii. අද්‍යතන , ගැමියෙකුගේ , ඓතිහාසික

iv. දීර්ඝ

v. සංස්කෘතිය - හල්කිරීම , ගැටය සහිත ඇලපිල්ල , කෙටි ඉස්පිල්ල
ප්‍රතිවිරෝධි - රකාරාංශය , කෙටි ඉස්පිල්ල , කොම්බුව , හල්කිරීම සහිත ඇලපිල්ල , කෙටි ඉස්පිල්ල
අනායාසයෙන් - ඇලපිල්ල , ඇලපිල්ල , කොම්බුව , හල් කිරීම

(8).

i. අස්ත්‍යර්ථයේ තද්ධිත ප්‍රත්‍යය.
අස්ත්‍යර්ථය යනු (අස්ති අර්ථය) යනු ''ඇත'' යන අදහසයි. කිසියම් තද්ධිත ප්‍රත්‍යයක් එක් වු කල එම ප්‍රත්‍යය එකතු වී ඇති ප්‍රකෘතියට එම ප්‍රකෘතියේ අර්ථය සහිතයි යන අදහස ලැබේ නම් එම ප්‍රත්‍යය අස්ත්‍යර්ථයේ තද්ධිත ප්‍රත්‍යය වේ. තද්ධිත ප්‍රත්‍යය විවිධාර්ථවල යෙදෙන අතර එසේ යෙදෙන එක් අර්ථයකි අස්ත්‍යර්ථය.

නිදසුන් ලෙස ගුණ යන ප්‍රකෘතියට ''වත්'' යන අස්ත්‍යර්ථ තද්ධිත ප්‍රත්‍යය එකතු වන කල ''ගුණවත්'' යන තද්ධිත ප්‍රත්‍යය සෑදේ. එවිට ගුණ යන ප්‍රකෘතියට ''වත්'' යන්නෙන් ''ඇත / සහිත'' යන අර්ථය ලැබේ. ඒ අනුව ගුණවත් යනු ගුණ ඇති / ගුණ සහිත යන අර්ථය යි. මේ අර්ථයෙහි

- ❖ ආදු , - ඉ , - වත් , - මත් , යන ප්‍රත්‍යය ශුද්ධ සිංහලයේ ද 'වන්ත , මත්ත යන ප්‍රත්‍යය මිශ්‍ර සිංහලයේ ද යෙදේ.

නිදසුන්,

බය + ආදු - බයාදු (බය සහිත)

බල + ඉ - බිලි (බල සහිත)

නිය + වත් - නියවත් (ඥානය සහිත)

රූ + මත් - රූමත් (රූපය සහිත)

වසනා + වන්ත - වසනාවන්ත (වසනාව සහිත)

ස්ද්ධි + මත්ත - ස්ද්ධිමත්ත (සෘද්ධිය සහිත)

'වත් / වන්ත , මත් / මත්ත ප්‍රත්‍යය යෙදීමේ විශේෂතාවයක් ඇත. ප්‍රකෘතිය අවසන් වන්නේ ''අ/ආ'' දෙකෙන් හෝ හලන්තව නම් ''වත් /වත්ත'' ප්‍රත්‍යයත් , ප්‍රකෘතිය අවසන් වන්නේ '' ඉ/ඊ/උ/ඌ ආදී ස්වරයකින් නම් ''මත් /මත්ත ප්‍රත්‍යයන් යෙදේ.

ii. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා -
අසම්භාව්‍ය ක්‍රියාවෙහි ප්‍රභේද දෙකකි. එනම් කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සහ අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා යනුවෙනි. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා යනු ක්‍රියා පදයෙන් එම ක්‍රියාව සිදුවන කාලය හඟවේ නම් එම ක්‍රියා පදයි. තවත් අයුරකින් එය මෙසේ ද විස්තර කළ හැකි. අසම්භාව්‍ය ක්‍රියා පදයෙන් ක්‍රියා අර්ථයට අමතර ව ''කල්හි'' යන අර්ථය ද ලැබේ නම් එම ක්‍රියාවයි. මෙය සකසා ගන්නා ආකාර කීපයක් ඇත.

- ❖ ධාතුවට ''ත් /ත'' ප්‍රත්‍ය එක් කිරීම
  කිය + ත (කියත) කියන කල්හි ''කියත උන් මෙතෙපල''
  සිඳ + ත (සිඳිත) සිඳින කල්හි
  මඩ + ත (මඩිත) මඩින කල්හි
  'සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ'

❖ 'ත් ' ප්‍රත්‍යාන්ත ක්‍රියා රූපයට ''දී'' නිපාතය එකතු කිරීම. මෙහිදී ''ත් දී '' යන කොටස '' ද් දී '' බවට පත්වේ.

කියත් + දී - කියද්දී (කියන කල්හි) ගුරුතුමා කියද්දී

වසිත් + දී - වසිද්දී (වැසි වසිද්දි ළමයි බලා සිටිති.)

❖ අතීත කාල කෘදන්තයට 'අ' ප්‍රත්‍යය යෙදීම

බැලු + අ - බැලුව (බැලු කල්හි) --- යොමු බැලුවද -----

කියු + අ - කියුව (කියු කල්හි) ඔහු ඇත්ත කියුව ද ජූරිය එය පිළි නොගනී.

❖ ශක්‍යාර්ථ කෘදන්තයට පසුව 'දී ' නිපාතය යෙදීම

සිටිය දී - සිටියදී (සිටින කල්හි) බුදුන් වැඩ සිටි කල්හි

**අන්‍යාර්ථ සමාසය - (අනරුත් සමස්)**

වෙනස් අර්ථ ඇති පද සමාස වීමෙන් අනතුරුව එකී පදවල අර්ථයෙන් පරිබාහිර වූ /අන්‍ය වූ අර්ථයක් සමාසයෙන් පැවසේ නම් ඒ අන්‍යාර්ථ සමාසය යි.

සමාසාර්ථය , වාච්‍යාර්ථය හා ව්‍යාකරණාර්ථය හෙවත් විභක්ත්‍යාර්ථය යනුවෙන් දෙවැදෑරුම් ය.

**නිදසුන් -** දස බල , මෙහි පදවල අර්ථය 'බල දහයක් එහෙත් සමාස වු කල්හි එයින් වාච්‍ය වනුයේ 'බුදුන්' යන අර්ථය යි.

බලදහයක් ඇත්තේ යමෙකුට ද /යමකුගේ ද ඔහු දසබල වේ. ඒ අනුව දසබල යන සම්බන්ධ විභක්ත්‍යාර්ථයෙහි අන්‍යාර්ථ සමාස නම් වේ.

අන්‍යාර්ථ සමාස විභක්ත්‍යාර්ථ වශයෙන් ප්‍රභේද හතකි. එනම් කර්ම , කර්තෘ , සම්ප්‍රදාන , අවධි , සම්බන්ධ , ආධාර යනුවෙනි.

**කර්මාර්ථය අපේක්ෂිත සමාස පද**

නිද - එරුනුහස් - හංසයා බැස්සා වූ තැන - එනම් විල හංසයා යම් තැනකට ද බැස්සේ එතැන විල යනුයි.

**කර්තෘ විභක්ති අන්‍යාර්ථ සමාසය**

පද දෙකක් සමාස වූ පසු කර්තෘ - අර්ථය අපේක්ෂිත නම් ඒ කර්තෘ විභක්ති අන්‍යාර්ථ සමාසය යි.

නිදසුන් - දැම්දුරු - දමනය කරන ලද ඉඳුරෝ යමෙක්හු විසින් ද ඒ දැම් දුරුයි. එනම් මුණි එනම් දමනය කරන ලද ඉන්ද්‍රිය යනුයි. ඉන්ද්‍රයන් දමනය කළ වු තැනැත්තා යි. එවිට එය කතෘ අර්ථය යි.

iii. කරන විභක්ති අන්‍යාර්ථ සමාස

සමාස වීමේදී කරණ අර්ථය අපේක්ෂිතය

සුන්තුරු - එනම් පොරොවයි

සුන්බත් - එනම් කලහය යි

තවත් නිදසුන් ලෙස

දුන්වත් - එනම් දෙන ලද වස්ත්‍රයි. වස්ත්‍ර ලබන්නා යනුයි. මෙය සම්ප්‍රදාන අර්ථ ගනී. දුන්වත් යනු බමුණා ය.

නිදසුන් - මී දුම - සීමා අර්ථය හඟවයි

සඳවත - සඳවන් මුහුණක් ඇත්ති එනම් ස්ත්‍රිය යි

සිඟුවළඟ - සිඟු වළඟ ඇත්තී එනම් ස්ත්‍රිය යි

පරපුටු , ලඹසවන් , සහතුරුවැළ , තිනෙත් , විදුරත් ආදි පද ද අස්ත්‍යාර්ථ සමාස පදය

**iv. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය**

සන්ධිවන පද දෙකෙන් පෙර පදයෙහි අගට යෙදෙන ගාත්‍රාක්ෂරය ලොප් කොට සඤ්ඤකය පූර්ණ නාසික්‍ය ශබ්දයක් බවට පත් කළ හෙයින් (එනම් මාත්‍රා වෘද්ධියට පත් කළ හෙයින් ) එම සන්ධිය ගාත්‍රාක්ෂර ලෝප සන්ධි නම් වේ.

නිදසුන් - ගඟ + රන් ගං (ග්) + රන්

නෙළුඹු +මල් - නෙළුම් (බ්) + මල් - නෙළුම්මල්

වඟු + මුතු - වං(ග්) + මුතු - වංමුතු

(අදාළ නිදසුන් පිළිතුරු ලෙස භාරගන්න.)

**අර්ධානු නාසික අක්ෂර**

අර්ධානු නාසික්‍යාක්ෂරවලට සඤ්ඤක අක්ෂර යන නම ද යෙදේ. අර්ධානුසික්‍යාක්ෂර යනු අනු නාසික ශබ්දයනගේ අර්ධයක් සහිත ව උච්ඡාරණය කෙරෙන්නා වූ ශබ්ද ලියා දක්වන අක්ෂරයි. සිංහලයේ පවතින ඟ , ඦ , ඬ , ඹ යන අක්ෂර පහ අර්ධානුනාසික හෙවත් සඤ්ඤක ලෙස සැලකේ. මේවායෙහි හට ගැනීම සම්බන්ධයෙන් සිදත් සඟරා කතුවරයා දක්වනුයේ අනු නාසික අක්ෂරයක් වන බින්දුවේ අර්ධයක් එහි ඇති බවයි. එළු සඳැස් ලකුණේ දැක්වෙන්නේ වර්ගයන්ගේ පඤ්චම අක්ෂර වූ ඞ , ඤ , ණ , ම යන අක්ෂරයන්ගේ අර්ධයක් එහි ඇති බවයි. නූතනයේ බහුතරයක් දෙනාගේ පිළිගැනීම එළු සදැස්ලකුණේ දැක්වෙන මතය යි.

අර්ධානුනාසික හෙවත් සඤ්ඤක අක්ෂර කිසිදු විටෙක වචනයක ආරම්භක අක්ෂරයක වශයෙන් නොයෙදේ. එය සැම විටම මැද හෝ අඟ අක්ෂරය වශයෙන් යෙදේ.

ඟ ඳ ඹ සොඬ ආදි වශයෙනි

නූතනයේ අර්ධානු නාසික්‍යාක්ෂර සැම විටම ස්වරයක් සහිතව ම භාවිත වේ. ඒවා ලේඛනයේ දී හල් අකුරු වශයෙන් නොයෙදේ.

ගඟ , අඹ ආදි වශයෙනි.